ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2021
-------------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොළඹ අධ්‍යාපන කලාප කාර්යාලයෙන් 2021 අප්‍රේල් මාසයට අදාල දායක මුදල් ලෙස 2021 ජූනි 25 දින ලැබූ රු. 2,904,049 ක් වර්ෂයේ ගිණුම්වලින් අත්හැරී තිබුණි. | පිළිගනිමි. කොළඹ අධ්‍යාපන කලාප කාර්යාලයෙන් 2021 අප්‍රේල් මාසයට අදාලව 2021 ජූනි 25 දින ලද රු.2,904,049.14 ක මුදල වැරදීමකින් 20.04.02.00 (පළාත් සභා) ශීර්ෂයට අදාලව බස්නාහිර පළාත යටතේ PIV අංක 11/710 ලෙස ආදායමට බැර කර ඇත. 2022 වර්ෂය දී එම වරද නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇත. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) ඉකුත් වර්ෂයට අදාල ලැබිය යුතු දායක මුදල් රු.20,933,783 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණ ද, අවසන් ගිණුමට ගැලපීමේ දී ඉකුත් වර්ෂයට අදාල ලැබිය යුතු ශේෂය | මෙම ගිණුමට අදාලව සේවය කරන ගුරුවරුන්ගේ මාසික වැටුප් ගෙවීමේ දී අය කර ගන්නා වැන්දඹු අනත්දරු මුදල් සඳහා එක් චෙක්පතක් අදාල මාසයට අනුව අප වෙත එවනු ලබයි. මෙසේ එවනු ලබන දායක මුදල් පවත්නා වර්ෂයට අදාල දායක මුදල ලෙස සැලකුව ද වැටුප් ගෙවීමේ හඳුනාගන්නා හිඟ වැන්දඹු අනත්දරු මුදල් | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව උපචිත පදනම මත ගිණුම් තැබීම කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| රු.19,069,163 ක් වීම හේතුවෙන් රු.1,864,620 ක් සමාලෝචිත වර්ෂයේ දායක මුදල් ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පසුව අප වෙත ප්‍රේෂනය කරනු ලබයි.එම අගයන් හා නිවැරදි කාල පරාසයන් පිළිබඳව නිශ්චිත අවබෝධයක් දෙපාර්තමේන්තු නිලධාරීන්ට ප්‍රායෝගිකව ලබා ගත නොහැකි හෙයින් මෙසේ එවනු ලබන පෙර වර්ෂයන්ට අදාල හිඟ දායක මුදල් ලැබීම්, පවත්නා මුදල් වර්ෂයේම ආදායම් ලෙස ගිණුම් ගත කරනු ලැබේ. හඳුනා ගන්නා හිඟ දායක මුදල් පමණක් ලැබිය යුතු දායක මුදල් ලෙස උපචිත පදනම මත ගිණුම් ගත කරනු ලැබේ. | |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් රු.6,636,632 ක් විය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායම රු.6,354,633 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් දායක මුදල් හා ලැබිය යුතු දායක මුදල් රු.281,999 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ගිණුමට මාසික වැටුප් ගෙවීමේ දී අය කර ගන්නා වැන්දඹු අනත්දරු මුදල් සඳහා එක් චෙක්පතක් අදාල මාසයට අනුව අප වෙත එවනු ලබයි. මෙසේ එවනු ලබන දායක මුදල් පවත්නා වර්ෂයට අදාල දායක මුදල ලෙස සැලකුව ද වැටුප් ගෙවීමේ දී සිදු වන දෝෂ නිවැරදි කර පෙර වර්ෂයන්හි හිඟ වැන්දඹු අනත්දරු මුදල් පසුව අප වෙත ප්‍රේෂනය කරනු ලබයි.එම අගයන් හා නිවැරදි කාල පරාසයන් පිළිබඳව නිශ්චිත අවබෝධයක් අප දෙපාර්තමේන්තු නිලධාරීන්ට ප්‍රායෝගිකව ලබා ගත නොහැකි හෙයින් මෙසේ එවනු ලබන පෙර වර්ෂයන්ට අදාල හිඟ දායක මුදල් ලැබීම්, පවත්නා මුදල් වර්ෂයේම ආදායම් ලෙස ගිණුම් ගත කරනු ලැබේ. හඳුනා ගන්නා හිඟ දායක මුදල් පමණක් ලැබිය යුතු දායක මුදල් ලෙස උපචිත පදනම මත ගිණුම් ගත කරනු ලැබේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව උපචිත පදනම මත ගිණුම් තැබීම කළ යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1953 අංක 44 දරන පාඨශාලිය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ නියෝග අංක 04 | ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල්වලින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කල යුතුය. එසේ වුවද, දායක මුදල් රැස්කිරීම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් | එකඟ වෙමි. | පනතේ නියෝග ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට රැස්කර තිබුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් කර තිබුණි. | | |
| (ආ) 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ නියෝග අංක 9(අ) | එක් එක් දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා දායක මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. තවද පළාත් 09 න් පළාත් 06 කින් පමණක් දායක මුදල් අරමුදලට ලැබී තිබුණු අතර අනෙක් පළාත්වලින් දායක මුදල් නොලැබීමට හේතු හෙළිදරව් නොවුණි. | අරමුදලට අදාල ආදායම් එකතු කිරීමේ බලධරයා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් එක් එක් මාසයට අදාළව පළාත් වලින් බැර කරනු ලබන වටිනාකම් පමණක් බැර නිවේදන මඟින් අප වෙත එවනු ලබන අතර ,එම දායක මුදල් අයවීම පිළිබඳ විස්තර එවීමක් සිදු නොකරනු ලබයි. කේවල ගිණුම් ක්‍රමයක් පවත්වාගෙන යාම ප්‍රයෝගික නොවන බවට නිරීක්ෂණය කරමි. පළාත් කිහිපයකින් පමණක් දායක මුදල් බැරවීම සම්බන්ධයෙන් 2019.06.27 දිනැති විවැ/ගිදාමු/වී.ඩබ්.පී/13/2019 දරන ලිපිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබීය.පසුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ පිළිබඳව මා හටද පිටපත් සහිතව සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු දැනුවත් කර ඇත. | දායක මුදල් ගෙවන්නන් පිළිබඳ විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 295,472,900 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 324,414,589 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.28,941,689 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දායක මුදල් ආපසු ගෙවීම් රු.7,658,209 කින් වැඩිවීම සහ ආයෝජන පොළී ආදායම රු.39,669,279 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂයේ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව, අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව, සතු සාමාජිකයන්ගේ නම, පාසල, ඇතුළත් උපලේඛනයක් නඩත්තු නොකිරීම හේතුවෙන් අරමුදලට වාර්ෂිකව සත්‍ය වශයෙන්ම ලැබිය යුතු මුදල, ලැබූ මුදල හා හිඟ මුදල් පිළිබඳ තොරතුරු නිවැරදිව වෙන් වෙන්ව හඳුනාගැනීමට නොහැකිව තිබුණි. | පිරිවෙන් හා උපකෘත පාසල් ගුරුවරුන්ගේ පුද්ගල නාමය ,පාසල් හෝ පිරිවෙන් , අයත් වන පළාත්, අරමුදලේ සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව හා අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව ආදිය පිළිබඳ මූලික තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් නිර්මාණය කර වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා පිරිවෙන් හා උපකෘත පාසල්හි සහයෝගයද අත්‍යවශ්‍ය වේ. නමුත් මෙම ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ දී හිඟ වැන්දඹු අනත්දරු දායක මුදල් ගණනය කර එම හිඟ මුදල් අයකර ගැනීමෙන් පසුව පමණක් ගෙවීම් සිදු කෙරේ. | අරමුදලේ සාමාජිකයන් පිළිබඳව යාවත්කාලීන උපලේඛනයක් නඩත්තු කල යුතු වීම. |